# ද්වාදසමො පාඨො

එකං සමයං භගවා මල්ලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසංඝෙන සද්ධිං යෙන ථූනං නාම මල්ලානං බ්‍රාහ්මණගාමො තදවසරි. අස්සොසුං ඛො, ථූනෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා 'සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො මල්ලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසංඝෙන සද්ධිං ථූනං අනුප්පත්තො'ති. උදපානං තිණස්ස ච භුසස්ස ච යාව මුඛතො පූරෙසුං 'මා තෙ මුණ්ඩකා සමණකා පානීයං අපංසූ'ති. අථ ඛො භගවා මග්ගා ඔක්කම්ම යෙන රුක්ඛමූලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. 'ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, එතම්හා උදපානා පානීයං ආහරා'ති. එවං වුත්තෙ, ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. ඉදානි සො, භන්තෙ, උදපානො ථූනෙය්‍යකෙහි බ්‍රාහ්මණගහපතිකෙහි තිණස්ස ච භුසස්ස ච යාව මුඛතො පූරිතො 'මා තෙ මුණ්ඩකා සමණකා පානීයං අපංසූ'ති. දුතියම්පි ඛො............ අපංසූ'ති. තතියම්පි ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. ඉඞ්ඝ මෙ ත්වං ආනන්ද, එතම්හා උදපානා පානීයං ආහරා'ති. එවං, භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා පත්තං ගහෙත්වා යෙන සො උදපානො තෙනුපසඞ්කමි. අථ ඛො සො උදපානො ආයස්මන්තෙ ආනන්දෙ උපසඞ්කමන්තෙ සබ්බං තං තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දන්තො මඤ්ඤෙ අට්ඨාසි. අථ ඛො ආයස්මතො ආනන්දස්ස එතදහොසි. අච්ඡරියං වත! භො, අබ්භුතං වත! භො, තථාගතස්ස මහිද්ධිකතා මහානුභාවතා. අයං හි සො උදපානො මයි උපසඞ්කමන්තෙ සබ්බං තං තිණඤ්ච භුසඤ්ච මුඛතො ඔවමිත්වා අච්ඡස්ස උදකස්ස අනාවිලස්ස විප්පසන්නස්ස යාව මුඛතො පූරිතො විස්සන්දන්තො මඤ්ඤෙ අට්ඨාසීති. පත්තෙන පානීයං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමි.

**(උදපානසුත්ත - උදානපාළි )**

**පදමාලාව**

| | | | |
|---|---|---|---|
| **චරමානො** | **(කි)** | - | හැසිරෙන්නේ |
| **තදවසරි** | **(සං)** | - | එතනට පැමිණියේ ය |
| **අස්සොසුං** | **(ක්‍රි)** | - | ඇසූහ |
| **ථූනෙය්‍යකා** | **(ත)** | - | ථූන ගම්වැසි |
| **පබ්බජිතො** | **(කි)** | - | පැවිදි වූ |
| **අනුප්පත්තො** | **(කි)** | - | පැමිණියේ |
| **උදපානං** | **(නා)** | - | ළිඳ |
| **තිණස්ස** | **(නා)** | - | තෘණවලින් |
| **භුසස්ස** | **(නා)** | - | පිදුරුවලින් |
| **යාව මුඛතො** | **(නි)** | - | (ළිං) කට දක්වා |
| **පූරෙසුං** | **(ක්‍රි)** | - | පිරවූහ |

| | | | |
|---|---|---|---|
| **මුණ්ඩකා** | (ත) | - | මුඬු |
| **(මා) අපංසූ** | (ක්‍රි) | - | (නො) බොත්වා |
| **මගගා** | (නා) | - | මාර්ගයෙන් |
| **ඔකකමම** | (පූ.ක්‍රි) | - | ඉවත්ව |
| **අඤ්ඤතරං** | (ස.නා) | - | එක්තරා |
| **නිසජ්ජ** | (පූ.ක්‍රි) | - | හිඳ |
| **පටිසසුත්වා** | (පූ.ක්‍රි) | - | පිළිවදන් දී |
| **ඔවමිත්වා** | (පූ.ක්‍රි) | - | බැහැරකොට |
| **අචඡසස** | (නා) | - | පිරිසිදු / පැහැදිලි |
| **අනාවිලසස** | (කි) | - | නොකැළඹුණු |
| **විපපසනනසස** | (කි) | - | පැදුණු |
| **විසසනෙදනෙතා** | (කි) | - | පිටතට නික්මෙන්නේ |
| **අචඡරියං** | (ත) | - | අශ්චර්යයකි |
| **මහිද්ධිකතා** | (ත) | - | මහත් සෘද්ධි ඇති බව |
| **මහානුභාවතා** | (ත) | - | මහත් අනුහස් ඇති බව |

**අභ්‍යාස**

01. 'තථාගතසස මහිද්ධිකතා මහානුභාවතා' ජේදය සිංහලට නගන්න.

02. පාලියෙන් පිළිතුරු ලියන්න.

i. භගවා කෙන සද්ධිං කිං නාම බ්‍රාහමණගාමෙ තදවසරි?
ii. ථූනෙය්‍යකා බ්‍රාහමණගහපතිකා උදපානං කෙහි පූරෙසුං?
iii. භගවා ආනන්දං ආමනෙතත්වා කිං අභාසි?
iv. ආනන්දො කෙන පානියං ආදාය භගවනතං උපසංකමි?
v. ආනන්දෙ උදපානං ගතෙ උදපානො කීදිසො අහවි?

02. ජේදයේ සඳහන් වාක්‍ය රටාව අනුගමනය කොට පාලියට නගන්න.

i. එක් කලෙක මලියදේව මහරහතන් වහන්සේ බොහෝ භික්‍ෂූන් සමඟ වට්ටාරම් විහාරයට (මණ්ඩලාරාම) පැමිණි සේක.
ii. ජනාධිපතිතුමා සෙංකඩගල නුවරට පැමිණියේ යැයි සෙන්කඩගල නුවර වැසියෝ ඇසූහ.
iii. නුවර වැසියෝ තෙරුන් වහන්සේලාගේ පාත්‍ර කට දක්වා කෑයුතු පියයුතු දැයින් (ඛාදනීය/භොජනීය) පිරවූහ.
iv. ස්වාමීනි, එසේයයි ශිෂ්‍යයෝ ගුරුවරයාට පිළිතුරු දී පොත් රැගෙන බෝධිමණ්ඩපය වෙත එළඹුණහ.
v. ළිඳේ ජලය පිරිසිදුව නොකැළඹී පැදී කටතෙක් පිරී ඇත.

03. ඡේදය ඇසුරෙන් පිළිතුරු ලියන්න.

i. වුන ජනපදය පිහිටා තිබුණේ කවර රාජධානියක ද?
ii. ආනන්ද තෙරුන් දැරූ තනතුරු මොනවා ද?
iii. බුදුරදුන්ගේ මහානුභාවය ප්‍රකට වූයේ කවර කරුණක් නිසා ද?
iv. බුද්ධ චරිතය සම්බන්ධ ඡේදයෙන් අනාවරණය වන කරුණු තුනක් ලියන්න.
v. බුදුරදුන්ගේ චාරිකාවට අකමැති වූවෝ කවරහු ද, ඔවුන් අකමැත්ත ප්‍රකාශ කළේ කෙසේ ද?

## තද්ධිත නාම II

### 1. අත්‍යර්ථ තද්ධිත නාම

ඇත යන අර්ථය දෙන තද්ධිත ප්‍රත්‍යය එක් වී සෑදෙන තද්ධිත නාම අත්‍යර්ථ තද්ධිත නමින් හැඳින්වේ.

**අත්‍යර්ථ තද්ධිත ප්‍රත්‍යය.**

**ආලු, තර, තම, ඉස්සික, ඉය, ඉට්ඨ, වී, සී, ඉක, ර්, වන්තු, මන්තු**

ආලු ප්‍රත්‍යය - "**ආලු තබ්බහුලෙ**"

බොහෝ කොට ඇත්තේ ය යන අර්ථයේ ආලු ප්‍රත්‍යය වේ.

**උදා** :- අභිජ්ඣා + ආලු - අභිජ්ඣාලු (දැඩි ලෝභය බොහෝ කොට ඇත්තේ)

**තර, තම, ඉස්සික, ඉය, ඉට්ඨ,** ප්‍රත්‍යය '**විසෙසෙ තරතමිස්සිකියිට්ඨා**'

| | | | | | |
|---|---|---|---|---|---|
| උදා:- පාප | + | තර | - | පාපතර | (අන්‍ය පාපීන්ට වඩා පාපි වූ) |
| පාප | + | තම | - | පාපතම | (පාපතරයාට වඩා පාපි වූ) |
| පාප | + | ඉස්සික | - | පාපිස්සික | (පාපතමයාට වඩා පාපි වූ) |
| පාප | + | ඉය | - | පාපිය | (පාපිස්සිකයාට වඩා පාපි වූ) |
| පාප | + | ඉට්ඨ | - | පාපිට්ඨ | (පාපියාට වඩා පාපි වූ) |

මෙහි **තර** ප්‍රත්‍යයට වඩා **තම** ප්‍රත්‍යය ද එයට වඩා **ඉස්සික** ප්‍රත්‍යය ද එයට වඩා **ඉය** ප්‍රත්‍යය ද එයට වඩා **ඉට්ඨ** ප්‍රත්‍යය ද අතිශයාර්ථ බව ප්‍රකාශ කරයි. අතිශයාර්ථය ප්‍රකාශ කිරීමට **ඉට්ඨ** ප්‍රත්‍යයට වඩා ඉහළ ප්‍රත්‍යයක් නොමැත.

**වී ප්‍රත්‍යය - තදස්සත්‍ථී ති වී ච**

එය මොහුට බොහෝ කොට ඇත්තේය යන අර්ථයෙහි
උදා :- මෙධා අස්ස අත්‍ථීති - මෙධාවී (ධාරණ ප්‍රඥාව මොහුට ඇත්තේය.)

**සී ප්‍රත්‍යය - තපාදිතො සී**

තප ආදී ශබ්ද වලින් පරව එය මොහුට ඇත්තේය යන අර්ථයෙහි සී ප්‍රත්‍යය වේ.
තපං අස්ස අත්‍ථීති - තපස්සී (තපස මොහුට ඇත්තේය.)

**ඉක, ඊ ප්‍රත්‍යය - දණ්ඩාදිතො ඉක ඊ**

දණ්ඩාදි ශබ්දවලින් පරව එය මොහුට ඇත්තේය යන අර්ථයෙහි ඉක, ඊ ප්‍රත්‍යය වේ.

උදා:- දණ්ඩ + ඉක - දණ්ඩික
දණ්ඩ + ඊ - දණ්ඩී

**වන්තු ප්‍රත්‍යය - ගුණාදිතො වන්තු**

ගුණ ආදි අකාරාන්ත ශබ්ද කෙරෙන් පරව එය මොහුට ඇත්තේ ය යන අර්ථයෙහි **වන්තු** ප්‍රත්‍යය යෙදේ.

උදා :- ගුණො අස්ස අත්‍ථීති - ගුණවන්තු

**මන්තු ප්‍රත්‍යය - සත්‍යාදිහි මන්තු**

ඉවර්ණාන්ත හා උවර්ණාන්ත ශබ්ද කෙරෙන පරව එය මොහුට ඇත්තේ ය යන අර්ථයෙහි **මන්තු** ප්‍රත්‍යය යෙදේ.

උදා :- සති + මන්තු - සතිමන්තු

**2. සංඛ්‍යා තද්ධිත නාම**

සංඛ්‍යා නාමවලට පසුව සංඛ්‍යා පූර්ණාර්ථ තද්ධිත ප්‍රත්‍ය එක් වී සංඛ්‍යා තද්ධිත නාම සෑදේ.

**සංඛ්‍යා තද්ධිත ප්‍රත්‍යය**

**තිය, ථ, ය, ම.**

''**තිය**'' ප්‍රත්‍යය - ''**ද්විතීහි තියො**''

**ද්වි, ති** ශබ්ද කෙරෙන් පරව තිය ප්‍රත්‍ය යෙදේ.

| | | | | |
|---|---|---|---|---|
| ද්වි | + | තිය | - | දුතිය |
| ති | + | තිය | - | තතිය |

**ථ, ඨ** ප්‍රත්‍යය - ''**චතුච්ඡෙහි ථ ඨා**''

චතු, ඡ කෙරෙන් පරව ථ, ඨ ප්‍රත්‍යය වේ.

උදා : චතු + ථ
චතු + ත් + ථ
චතුත්ථ

ඡ + ඨ
ඡ + ට් + ඨ
ඡට්ඨ

**''තෙසමඩ්ඪූපපදෙනඩ්ඪුඩ්ඪදිවඩ්ඪදියඩ්ඪඩ්ඪතියා''**

අඩ්ඪ යන උපපදය සහිත චතුත්ථ, දුතිය, තතිය යන මේවාට පිළිවෙළින් අඩ්ඪුඩ්ඪ දිවඩ්ඪඅඩ්ඪතිය යන ආදේශ වේ.

| | | | |
|---|---|---|---|
| අඩ්ඪෙන චතුත්ථො | > | අඩ්ඪුඩ්ඪ | (තුනහමාර) |
| අඩ්ඪෙන දුතියො | > | දිවඩ්ඪ | (එකහමාර) |
| අඩ්ඪෙන තතියො | > | අඩ්ඪතියො | (දෙකහමාර) |

**ම** ප්‍රත්‍යය - **සංඛ්‍යාපූරණෙ මො**

පඤ්චාදි ශබ්ද කෙරෙන් පරව ම ප්‍රත්‍යය වේ.

උදා :-

| | | | | |
|---|---|---|---|---|
| පඤ්ච | + | ම | - | පඤ්චම |
| සත්ත | + | ම | - | සත්තම |
| අට්ඨ | + | ම | - | අට්ඨම |
| දස | + | ම | - | දසම |

## 3. භාව තද්ධිත නාම

ඔහුගේ ස්වභාවය යන අර්ථයෙහි භාවාර්ථවත් ණ්‍ය ආදි ප්‍රත්‍යය යෙදී සෑදෙනුයේ භාව තද්ධිත නම් වේ.

**භාව තද්ධිත ප්‍රත්‍යය**

ණ්‍ය, ත්ත, තා ත්තන, - **''ණ්‍යත්තතා භාවෙතු''**

ණ්‍ය ප්‍රත්‍යය

| | | | | | |
|---|---|---|---|---|---|
| කුසල | + | ණ්‍ය | - | කොසලල | (හසුරු බව) |
| සමාන | + | ණ්‍ය | - | සාමඤ්ඤ | (සමාන බව) |
| අරොග | + | ණ්‍ය | - | ආරොග්‍ය | (නිරෝගි බව) |

**ත්ත ප්‍රත්‍යය**

| | | | | | |
|---|---|---|---|---|---|
| නීල | + | ත්ත | - | නීලත්ත | (නිල්බව) |
| සෙට්ඨ | + | ත්ත | - | සෙට්ඨත්ත | (ශ්‍රේෂ්ඨබව) |

**තා ප්‍රත්‍යය**

| | | | | | |
|---|---|---|---|---|---|
| මුදු | + | තා | - | මුදුතා | (මෘදුබව) |
| කතඤ්ඤු | + | තා | - | කතඤ්ඤුතා | (කෙළෙහිගුණ දන්නා බව) |

**ත්තන ප්‍රත්‍යය**

| | | | | | |
|---|---|---|---|---|---|
| පුථුජ්ජන | + | ත්තන | - | පුථුජ්ජනත්තන | (පුහුදුන් බව) |

## 4. අව්‍ය තද්ධිත නාම

වාර විභාග ආදි අර්ථ ප්‍රකාශ කරන තද්ධිත ප්‍රත්‍යය එක්ව අව්‍ය තද්ධිත නාම සෑදේ. මෙහිදී තද්ධිත නාමය අව්‍යයක් බවට පත්වේ.

**අව්‍ය තද්ධිත ප්‍රත්‍යය**

**ක්ඛත්තුං, ධා, ථා, ත්ත**

**ක්ඛත්තුං** ප්‍රත්‍යය

| | | | | | |
|---|---|---|---|---|---|
| එක | + | ක්ඛත්තුං | - | එකක්ඛත්තුං | (එක්වරක් |
| ද්වි | + | ක්ඛත්තුං | - | ද්වික්ඛත්තුං | (දෙවරක් |

ධා ප්‍රත්‍යය

| | | | | | |
|---|---|---|---|---|---|
| එක | + | ධා | - | එකධා | (එක් අයුරකින්) |
| කති | + | ධා | - | කතිධා | (කී අයුරකින්) |

ථා ප්‍රත්‍යය

සබ්බ + ථා - සබ්බථා (සෑම අයුරකින්)
අඤ්ඤ + ථා - අඤ්ඤථා (අන් අයුරකින්)

තත ප්‍රත්‍යය

අජ්ජ + තත - අජ්ජතත (අද පටන්)

**අභ්‍යාස**

01. පාලියට නගන්න.

i. සඤ්ජය පිරිවැජියා පිරිවැජියන් දෙසිය පණහක් (අඩඑතෙයාා සතෙහි) සමග රජගහ නුවර වසයි.
ii. ගුණවන්ත කුමාරවරු සිල්වත් උපාසකවරුන්ට උවටැන් කරති.
iii. දිළිඳු බව වැඩි වූ කල්හි සොරකම විපුල බවට ගියේ ය.
iv. මම පළමුවත් දෙවනුවත් තෙවනුවත් බුදුන් සරණ යමි.
v. චුල්ලපන්ථක තෙර රහත්බව ලැබ තමා දහස්වරක් මවා අඹ වනයේ හුන්නේ ය.

02. සිංහලයට නගන්න.

i. ගුණවන්තා මනුස්සා පාණාතිපාතම්හා විරමන්ති.
ii. අපරභාගෙ සො ආරඤ්ඤකම්භාහයත්ථෙරො' ති පාකටො අහොසි.
iii. මෙධාවිනො සිස්සා ගරූනො ගාරවං කත්වා නානාසත්ථෙසු පාටවං ලභන්ති.
iv. සච්චවාදී තපස්සිනො වාචාලා න භවන්ති.
v. සත්තධා මෙ එලෙ මුද්ධා ජීවන්තො න සුඛං ලභෙ.

03. පහත වගුව සම්පූර්ණ කරන්න.

| තද්ධිත පදය | ප්‍රත්‍යය වෙන්කිරීම | තද්ධිතය ප්‍රභේදය | තද්ධිත පදයේ අදහස |
|---|---|---|---|
| උදා : -ධම්මික | ධම්ම + ණික | අනේකාර්ථ | ධර්මයෙහි හැසිරෙන්නා |
| ථුනෙය්‍යකා | | | |
| ගහපතිකා | | | |
| ගොතමො | | | |
| සමණකා | | | |
| මුණ්ඩකා | | | |
| තතියං | | | |
| දුතියං | | | |

| | | | |
|---|---|---|---|
| අච්ඡරියං | | | |
| මහිද්ධිකතා | | | |
| මහානුභාවතා | | | |

04. පහත වගුව සම්පූර්ණ කරන්න.

| නාමය | අර්ථය | තද්ධිත පදය |
|---|---|---|
| උදා : අරොග | නිරෝගිකම | ආරොග්‍ය |
| මෙධා | නුවණ ඇති | .......................... |
| රාජ | රජ පරපුරට අයත් | .......................... |
| මගධ | මගධයෙහි උපන් | .......................... |
| සමුද්ද | මුහුදට අයත් | .......................... |
| පඤ්ච | පස්වැනි | .......................... |
| සබ්බ | හැම අයුරකින් | .......................... |
| පුථුජ්ජන | පුහුදුන් බව | .......................... |
| කති | කීවරක් | .......................... |
| තප | තපස් ඇති | .......................... |
| මග | මුව වැද්දා | .......................... |